පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරය
நுகர்வோர் உரிமைகள் பாதுகாப்புக்கான தேசிய இயக்கம்
NATIONAL MOVEMENT FOR CONSUMER RIGHT'S PROTECTION
NMCRP Your rights, Our mission Reg - CAA/CO/397
අංක: 191, කටුවාවල, බොරලැස්ගමුව.
No: 191, Katuwawala, Boralesgamuwa, Sri Lanka.
ටෙලි/ Tel: +94 11 5249300, 0777205137
email: crpnolanka@gmail.com
web: www.crplanka.org

2018-03-09

සභාපතිනිය,

මානව හිමිකම් කොමිෂම

කොළඹ

<u>පැමිණිල්ලයි</u>.

**පැමිණිලිකරු**

රංජිත් විතානගේ-සභාපති පාරිභෝගික අයිතීන් සුරකීමේ ජාතික ව්‍යාපාරය අංක 191 කටුවාවල බොරලැස්ගමුව

<u>වගඋත්තරකරුවන්</u>

01. ඔස්ටින් ප්‍රනාන්දු- සභාපති ශ්‍රී ලංකා විදුලි සංදේශන කොමිෂන් සභාව

    ඇල්විටිගල මාවත කො ළඹ 06

02 කපිල වෛද්‍යරත්න ලේකම්

    ආරක්ෂක අමාත්‍යාංශය කොළඹ 01

01. රංජිත් විතානගේ වන මම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකි. තොරතුරු ලබාගැනීම සඳහා සහ අදහස් ප්‍රකාශ කිරීම සඳහා මා විසින් සමාජ ජාලා මාධ්‍ය භාවිතා කරනු ලබයි. එම පහසුකම ලබා ගැනීම සඳහා මා විසින් අන්තර්ජාලය භාවිතා කරන අතර ඒ සඳහා මුදල් ගෙවීමක් කරණු ලබයි.
02. 2018/03/06 දින සිට මෙහි දෙවන වග උත්තරකරුගේ උපදෙස්මත පළමු වගඋත්තරකරු විසින් සමාජජාලා මාධ්‍ය සීමා කරන ලදී. ඒ අනුව මේ වන විට මාහට මුහුණු පොතට පිවිසීම, viber, whatsapp යන ආදියට පිවිසීමට නොහැකි වන ආකාරයට එම සේවාවන් අවහිර කර ඇත.

එසේ කිරීම තුලින් 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාස්ථාවේ 14 (1) (අ ) වගන්තිය උල්ලංඝණය කර ඇත.

14 (1) වගන්ති ජාතික ආරක්ෂාව හා ජාතීන් අතර වාර්ගික හා ආගමික සහයෝගීතාව සඳහා සීමා කිරීම කළ හැකිවුව ද එසේ එසේ සීමාකිරීමට තරම් හේතුවක් පැනනැගී නැත.

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාස්ථාවේ 14 (1) (අ) වගන්ති උල්ලංඝණය කිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස ඔබ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිමි.

මෙයට, විශ්වාසි



**රංජිත් විතානගේ -** සභාපති

පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරය

.